ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය

# University of Sri Jayewardenepura

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

## External Degrees and Extension Courses Unit

## 2023 වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීම - අදියර II

ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය මගින් පවත්වනු ලබන වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාවට 2023 අධ්‍යයන වර්ෂයට අදියර II යටතේ සීමිත සිසුන් සංඛ්‍යාවක් ලියාපදිංචියට තෝරා ගැනීම අ.පො.ස. උසස් පෙළ සමත් ඉහළ Z අගය සහ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ සනාතන සභාවේ අනුමත වෙනත් සුදුසුකම් පදනම්ව සිදු කරන ලදී.

ලියාපදිංචිවීම සඳහා ඔබ සුදුසුකම් ලබා තිබේද යන්න පහත දිගුව වෙත පිවිස ඔබගේ ජාතික හැඳුනුම්පත් අංකය V අක්ෂරය රහිතව ඇතුළත් කිරීමෙන් දැන ගත හැකිය. ඒ අනුව ඔබ විසින් එවා ඇති ලේඛනයන්හි නිරවද්‍යතාවය සනාථ කිරීමට යටත්ව සහ නියමිත ලියාපදිංචි ගාස්තු හා පාඨමාලා ගාස්තු පළමු වාරිකය ගෙවූ පසු වාණිජවේදී (සාමාන්‍ය) බාහිර උපාධි පාඨමාලාව සඳහා ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු කරනු ඇත.

2024 පෙබරවාරි මස සිට 2023 අධ්‍යයන වර්ෂයේ දේශන කටයුතු ආරම්භ කෙරෙන බැවින් **2024-01-31** දිනට පෙර **ලියාපදිංචි ගාස්තු රු.15,000.00** සහ **පාඨමාලා ගාස්තු පළමු වාරිකය රු.50,000.00** ගෙවා ලියාපදිංචි වන ලෙස දන්වමි.

නියෝජ්‍ය ලේඛකාධිකාරි

බාහිර උපාධි හා විස්තාරිත පාඨමාලා ඒකකය

2024-01-17